# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය


## 5 ශ්‍රේණිය - පරිසරය ( සැප්තැම්බර් -2 සතිය )

### 12 තේමාව - **මිනිස් හැසිරීම්**

❖ ක්‍රියාකාරකම 1

දුවේ, පුතේ, සමාජයක් ලෙස මිස, මිනිසාට තනිව ජීවත්විය නොහැක. එමනිසා මිනිසුන් සැමවිටම අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. අන් අය සමඟ සහයෝගයෙන් ජීවත්වීමට නම් අප විසින් සිදුකළ යුතු දේවල් මොනවාද කියා ඔබේ නිවසේ සියලුදෙනාම එක්වී සාකච්ඡා කරන්න.

(වැඩිහිටියන්ට ගරු කිරීම, අන් අයගේ අදහස්වලට ගරු කිරීම, තමාගේ අවස්ථාව ලැබෙන තෙක් ඉවසීම, බෙදාහදා ගැනීම, ලදදෙයින් සතුටුවීම, ආදරය, කරුණාව ආදී දේවල්.)

❖ ක්‍රියාකාරකම 2.

පුතාලා නිවසේ අනෙක් අය සමඟ එකතු වී මිදුල පිරිසිදු කර මල් පාත්තියක් සකස් කරන්න. (ඉන් ඇති වූ එකමුතුකමේ අගය හා සතුට පිළිබඳව සියලුදෙනා එක්ව කතාකරන්න.)

❖ ක්‍රියාකාරකම 3.

පුතේ අපි සමාජයේ අනෙක් අය සමඟ කටයුතු කිරීමේ දී අපි කියන කරන දේවලින් අන් අයගේ ගරුත්වයට හානියක් සිදුවේද යන්න සිතාබලා කටයුතු කළයුතුයි. අපි කොහොමද අන් අයගේ ගරුත්වයට හානියක් සිදු නොවන අයුරින් කටයුතු කරන්නේ කියා නිවසේ වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.

- ඔබට කෙනෙකු උදවු උපකාර කළ අවස්ථාවලදී ඔබ ප්‍රකාශ කළ නිරහංකාර වචන කිහිපයක් ලියන්න.

❖ E nanapiyasa 5 ශ්‍රේණිය පරිසරය -12 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.